ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2018.12.13 |

## ශ්‍රී ලංකා මහ බැංකුව සිය එකොළොස්වැනි ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව පැවැත්වීය

ශ්‍රී ලංකා මහ බැංකුව සිය එකොළොස්වැනි ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව 2018 වසරේ දෙසැම්බර් මස 07 වැනි දින ජෝන් එක්ස්ටර් ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වීය. මෙම සමුළුව, විවිධ විෂය පරාසයන්ට අයත් පර්යේෂකයන්ට තම අත්දැකීම් සහ අදහස් ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවක් ලබා දෙන අතරම, කාලීන සාර්ව ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ සෛද්ධාන්තික සහ ප්‍රායෝගික පර්යේෂණ සිදු කිරීම දිරිගැන්වීම අරමුණු කර ගනිමින් වාර්ෂිකව පවත්වනු ලබයි. මෙම වසරේ සමුළුව “උද්ධමන ඉලක්කකරණය සහ මහ බැංකුවේ ස්වාධීනත්වය, වගවීම සහ විනිවිදභාවය” යන තේමාව යටතේ පවත්වනු ලැබීය.

සමුළුවේ සමාරම්භක දේශනය ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා විසින් පවත්වන ලදී. සමුළුව අමතමින් මහ බැංකු අධිපතිතුමා සාර්ව ආර්ථික සහ මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී ආර්ථිකයෙහි සහ වෙළඳපොළෙහි ඉහළ යන සංකීර්ණ බව සැලකිල්ලට ගැනීමේ අවශ්‍යතාවය අවධාරණය කළ අතර, මහ බැංකුවේ නව මූල්‍ය ප්‍රතිපත්ති රාමුව ලෙස නම්‍යශීලී

උද්ධමන ඉලක්කකරණය සඳහා යොමුවීමේදී ශ්‍රී ලංකාව ලබා ඇති ප්‍රගතිය කෙටියෙන් පැහැදිලි කළේය. සමුළුවෙහි ප්‍රධාන දේශනය, ඉන්දියානු සංඛ්‍යාන ආයතනයෙහි (ISI) ආර්ථික විද්‍යාව සහ සැලසුම්කරණය ඒකකයෙහි ආර්ථික විද්‍යාව සම්බන්ධ මහාචාර්යවරයෙකු මෙන්ම ඉන්දියානු සංචිත බැංකුවෙහි මුදල් ප්‍රතිපත්ති කමිටුවෙහි සාමාජිකයෙකු ද වන මහාචාර්ය චේතන් ඝතේ මහතා විසින් පවත්වනු ලැබීය. *"Monetary Business Cycles: Evidence from India"* මැයෙන් වූ සිය ප්‍රධාන දේශනයේ දී මහාචාර්ය ඝතේ මහතා උද්ධමන ඉලක්කකරණ රාමුවක් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමෙහිලා කාර්යක්ෂම මුදල් ප්‍රතිපත්ති යාන්ත්‍රණයක ඇති වැදගත්කම අවධාරණය කළේය. අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනයේ විධායක අධ්‍යක්ෂක ආචාර්ය හාන්ස් ගෙන්බර්ග් මහතා විසින් *"On the Role of the Exchange Rate in an Inflation Targeting Strategy"* යන මැයෙන් ආරාධිත දේශනය පවත්වන ලදී. ආචාර්ය ගෙන්බර්ග් මහතා සිය දේශනයේදී සාර්ව ආර්ථික සහ මූල්‍ය පද්ධති ස්ථායිතාවය යන අවසාන අරමුණු සමඟ මහ බැංකු විධිවිධානයන් මනාව අනුකූල විය යුතු බව සහ මහ බැංකුවේ මෙම අවසාන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙවලමක් ලෙස විනිමය අනුපාතිකය සැලකිල්ලට ගත යුතු බව පැහැදිලි කළේය.

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතා සහ නියෝජ්‍ය අධිපති කේ.ඩී. රණසිංහ මහතා සමුළුවෙහි තාක්ෂණික සැසි දෙකෙහි මුලසුන හෙබවූහ. දැඩි ඇගයීම් ක්‍රියාවලියක් තුළින් තෝරා ගනු ලැබූ, සාර්ව ආර්ථික සහ මූල්‍ය අංශයේ ගැටලු පිළිබඳ විග්‍රහ කෙරෙන පර්යේෂණ පත්‍රිකා අටක් ඕස්ට්‍රේලියාව, චිලී රාජ්‍ය, ජර්මනිය, ඉන්දියාව, මෝල්ටා රාජ්‍යය සහ ශ්‍රී ලංකාව යන රටවල් නියෝජනය කරමින් පැමිණි පර්යේෂකයන් මෙන්ම, ශ්‍රී ලංකා මහ බැංකුවේ පර්යේෂකයන් විසින් මෙහිදී ඉදිරිපත් කරන ලදී. පර්යේෂණවල විශිෂ්ඨත්වය ඇගයීමට ලක් කරමින්, හොඳම පර්යේෂණ පත්‍රිකාව සඳහා පිරිනමන ආචාර්ය ඩී.එස්. විජේසිංහ අනුස්මරණ සම්මානය චිලී රාජ්‍යයේ මහ බැංකුවේ ආචාර්ය මයිකල් පෙඩර්සන් මහතා විසින් ඉදිරිපත් කරන ලද *"Understanding De-anchoring of Inflation Expectations: Evidence from Chile"* යන පර්යේෂණ පත්‍රිකාව සඳහා හිමි විය.

# ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවේ ඡායාරූප කිහිපයක්



*පසුපෙළ වමේ සිට:* චුතිපා ක්ලන්ජතුරවේත් මහත්මිය (තායිලන්ත මහ බැංකුව), මහාචාර්ය දේවෝජෝති මජුම්ඩර් මහතා (ඉන්දියානු කළමනාකරණ ආයතනය, ඉන්දූර්, ඉන්දියාව), ආචාර්ය ලූකා බෟඤ්ඤොලීනි මහතා (මෝල්ටා මහ බැංකුව), සහාය මහාචාර්ය යනික් ලූකොට් මහතා (ඕර්ලීන්ස් විශ්ව විද්‍යාලය), ආචාර්ය ලසිත ආර්.සී. පත්බේරිය මහතා (ශ්‍රී ලංකා මහ බැංකුව), මහාචාර්ය සැන්ඩි සුආඩි මහතා (වොලොන්ගොන් විශ්ව විද්‍යාලය), ආචාර්ය මයිකල් පෙඩර්සන් මහතා (චිලී රාජ්‍ය මහ බැංකුව), සහ ආචාර්ය කිෂාන් අබේගුණවර්ධන මහතා (ලෝක බැංකුව)

*ඉදිරිපෙළ වමේ සිට:* ආචාර්ය චන්ද්‍රනාත් අමරසේකර මහතා (අතිරේක අධ්‍යක්ෂ, ආර්ථික පර්යේෂණ සහ පර්යේෂණ උපදේශක කමිටු සභාපති), ස්වර්ණා ගුණරත්න මහත්මිය (සහකාර අධිපති), එච්.ඒ. කරුණාරත්න මහතා (නියෝජ්‍ය අධිපති), ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතා (ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති), මහාචාර්ය චේතන් ඝතේ මහතා (ඉන්දියානු සංඛ්‍යාන ආයතනය සහ ඉන්දියානු සංචිත බැංකුවේ මුදල් ප්‍රතිපත්ති කමිටු සාමාජික), ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා (අධිපති), ආචාර්ය හාන්ස් ගෙන්බර්ග් මහතා (විධායක අධ්‍යක්ෂක, අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනය, ක්වාලාලම්පූර්), කේ.ඩී. රණසිංහ මහතා (නියෝජ්‍ය අධිපති), ආචාර්ය යුතිකා ඉන්ද්‍රරත්න මහත්මිය (අධ්‍යක්ෂ, ආර්ථික පර්යේෂණ), සහ ආචාර්ය පී.කේ.ජී. හරිස්චන්ද්‍ර මහතා (අතිරේක අධ්‍යක්ෂ, ආර්ථික පර්යේෂණ)



**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති, ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා සමාරම්භක දේශනය පවත්වමින්**



මහාචාර්ය චේතන් ඝතේ මහතා ප්‍රධාන දේශනය පවත්වමින්




ආචාර්ය හාන්ස් ගෙන්බර්ග් මහතා ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව අමතමින්